වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2023

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 215

අන්තර්ගතය	පිටු අංකය
01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය	01 - 06
02 වන පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම	07 - 13
03 වන පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය	14 - 33
04 වන පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක	34
05 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	35 - 36
06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	37 - 39
07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	40 - 45

1 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලිය ආරම්භ වූයේ 1893 වර්ෂයේ දී රජය විසින් දුම්රිය දෙපාර්තමේන්තුව ආසන්නයේ පිහිටා තිබූ ප්‍රතිසංස්කරණය කරන ලද කෝපි ගබඩාවක මරදාන කාර්මික පාසල ස්ථාපනය කිරීමත් සමඟය. මෙම විද්‍යාලය මේ වන විට වසර 130 ක අභිමානවත් සේවා කාලයක් සම්පූර්ණ කර ක්‍රියාත්මක වෙමින් පවතී. පසුව ශ්‍රී ලංකා අධ්‍යාපන පනත යටතේ ආරම්භවූ කාර්මික පාසල් ජාලයක් දිවයින පුරා පිහිට වූ අතර 1994 වර්ෂයේදී කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව 1 වන ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කර එම විද්‍යාලවල පරිපාලන කටයුතු දෙපාර්තාමේන්තුව යටතට පත්විය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුව යටතේ තාක්ෂණ විද්‍යාල 09 ක් හා කාර්මික විද්‍යාල 30ක් ක්‍රියාත්මක වේ . දිවයින පුරා පිහිටුවා ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාල ජාලය මගින් පාසැල් හැර ගිය හා රැකියා අපේක්ෂිත තරුණ තරුණියන්හට නවීන කාර්මික හා තාක්ෂණික පුහුණුවක් ලබා දෙමින් දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලේ විවිධ ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා මංපෙත් විවරකර දෙනු ලබයි. මෙම තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 මඟින් NVQ සහ සහතික පත්‍ර පාඨමාලා සියයකට වැඩි ප්‍රමාණයක් විවිධ කර්මාන්ත අංශ 18 ක් යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

සියළුම කාර්මික විද්‍යාල මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 3,4 හා සහතිකපත්‍ර පාඨමාලා පවත්වයි. සුදුසුකම් ලත් සිසුන්හට දිවයිනේ පළාත් 9 හි පිහිටි තාක්ෂණ විද්‍යාල මඟින් NVQ 5 සහ 6 මට්ටමේ ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා හැදෑරිය හැකි අතර ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව හරහා පුහුණුලාභීන්ගේ නිපුණතා නුපුහුණු මට්ටමේ සිට ප්‍රවීණ ශිල්පී මට්ටම දක්වා උසස් කිරීමට හැකියාව ලැබී ඇත. එසේම ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමාධාරීන්ට NVQ 7 මට්ටමේ සුදුසුකම් ලබාගැනීම සඳහා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයට (UNIVOTEC) ඇතුළු විය හැකි අතර එමඟින් සිසුන්ට තාක්ෂණවේදී උපාධියක් හෝ අධ්‍යාපන තාක්ෂණ උපාධියක් ලබා ගැනීමට අවස්ථාව සැලසී ඇත.

මෝටර් කාර්මික තාක්ෂණය, කෘෂිකර්ම නිෂ්පාදන හා ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය, ආහාර තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, මෙකාට්‍රොනික්ස් තාක්ෂණය, ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය, විදුලි සංදේශන තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය, වෙල්ඩින් තාක්ෂණය, නිෂ්පාදන තාක්ෂණය ආදී තාක්ෂණ පාඨමාලා මෙන්ම පේස්ට්‍රි බේකරි හා ඉවුම් පිහුම් යන වෘත්තීය පාඨමාලාද ගණකාධිකරණය , ලේකම් පරිචය,ලඝුලේඛණය හා නාවික ප්‍රවාහන කළමණාකරනය ඇතුළු පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන්හි පවත්වාගෙන යන අතර තත්ත්ව සහතික පද්ධතියක් යටතේ අඛණ්ඩව පුහුණු ක්‍රමවේදය ඇගයීම් කර මෙම පාඨමාලා තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් ප්‍රතිනතය කර ඇත. කාලීන රැකියා වෙළඳපල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා නව රැකියා ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සඳහා වරින් වර විෂයමාලා සකස් කරනු ලබන අතර පවතින පාඨමාලා නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි අඛණ්ඩව යාවත්කාලීන කෙරේ.වරින් වර ක්‍රියාත්මක කරන ලද විදේශ ආධාර ව්‍යාපෘති හරහා හඳුනාගත් වෘත්තීය හා කාර්මික ක්ෂේත්‍රවල පාඨමාලා යාවත්කාලීන කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම ගුරුවරුන්ගේ පුහුණු යාවත්කාලීන කිරීමද සිදුවිය.

පසුගිය වසර 130 ක කාලය තුල දිනෙන් දින විකාශනය වූ ගෝලීය කාර්මික ක්ෂේත්‍රයන්ට ගැලපෙන පරිදි කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පද්ධතිය සැලකිය යුතු ලෙස යාවත්කාලීන කර ජාතික මෙන්ම ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි මානව සම්පත සංවර්ධනය කිරීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව කටයුතු කල අතර නිපුණතා ගොඩනැගීම තුලින් මානව

සම්පත සංවර්ධනය කර දැනුම පදනම් කරගත් ආර්ථිකයක් සහිත ඉහල මැදි ආදායම්ලාභී රටක් බවට පරිවර්තනය කිරීම සඳහා මහත් දායකත්වයක් ලබා දෙනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජාත්‍යන්තරව උසස් පිළිගැනීමකින් යුත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

අපගේ සේවාලාභීන්ට උසස් තත්වයෙන් යුත් දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන ආයතනය ලෙස කටයුතු කිරීම.


අරමුණු

- පාසල් හැර යන තරුණ තරුණියන්ට සහ රැකියාවල නියුතු පුද්ගලයන්ට තාක්ෂණික අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම.
- තාක්ෂණ හා කාර්මික අධ්‍යාපනය තුළින් උපාධි මට්ටමට ළඟා වීමට මාර්ගයක් නිර්මාණය කිරීම.
- රටේ ආර්ථික සංවර්ධනය සඳහා මානව ප්‍රාග්ධනය සැපයීම.
- ස්වයං රැකියා සහ කර්මාන්ත අංශයට මඟ පෙන්වන නිපුණතා සැපයීම.
- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන හා තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන්හට කාර්මික අධ්‍යාපන අවස්ථා සලසා දීම.

1.3 කාර්යයන්

- කාර්මික අධ්‍යාපනය හා ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මඟ පෙන්වීම, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.
- කාර්මික අධ්‍යාපනය සහ පුහුණු කිරීම වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය.
- කාර්මික අධ්‍යාපනය හා පුහුණු ක්‍රමය තුල අනුමත ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට අනුව පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ සමග ඒකාබද්ධ ක්‍රියාකාරී වැඩසටහන් සැකසීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.
- කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු සිදු කිරීම හා නව නිපැයුම් සඳහා අවකාශ සලසා දීම.

1.4 දෙපාර්තමේන්තුවේ ආයතනික ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති අංශයන්

1. පරිපාලන අංශය
2. අධ්‍යයන අංශය
3. පරීක්ෂණ සහ ඇගයීම් අංශය
4. වෘත්තීය මාර්ගෝපදේශන සහ අලෙවි අංශය
5. පර්යේෂණ සහ සංවර්ධන අංශය
6. තාක්ෂණික සහාය සේවා අංශය
7. සැලසුම් අංශය
8. යටිතල පහසුකම් සංවර්ධන අංශය
9. නඩත්තු අංශය
10. මූල්‍ය කළමනාකරණ අංශය
11. කළමනාකරණ තොරතුරු ඒකකය

1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන (ඇමුණුම 1)

තාක්ෂණ විද්‍යාල	-	09
කාර්මික විද්‍යාල	-	30

1.7 දෙපාර්තමේන්තුවට ලැබෙන අරමුදල්

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේ දී විවිධ මූලාශ්‍රවලින් පහත පරිදි අරමුදල් වෙන් කරන ලදී.

	අරමුදල් මූලාශ්‍රය	2023 සඳහා වෙන් කළ ප්‍රතිපාදනය (රු. මි)	2023.12.31 දිනට වියදම	ප්‍රගතිය %	
				මූල්‍ය	භෞතික
ඒකාබද්ධ අරමුදල					
1.	ප්‍රාග්ධන	121.137	42.77	35	85
2.	පුනරාවර්තන	2,316.00	2,160.87	93	100
අයවැය යෝජනා					
3.	මරදාන තාක්ෂණ විද්‍යාලය නවීකරණය කිරීම	*20.00	19.60	98	35
	මාතර කාර්මික විද්‍යාලය නවීකරණය කිරීම	*7.00	7.04	90	70
විදේශීය අරමුදල්					
4.1	කාර්මික හා තාක්ෂණ විද්‍යාල වල ඉදිකිරීම් පාඨමාලා වල ධාරිතාව වර්ධන ව්‍යාපෘතිය යටතේ වැඩහල් ප්‍රතිනිර්මාණය කිරීම.	159.500	108.728	68	100
4.2	වැඩහල් හා විද්‍යාගාර සඳහා ඉන්ධන හා ගෑස් මිලදී ගැනීම	2.502	0.059	2	10
දේශීය මූල්‍යණය					
4.3	කොරියානු ආධාර යටතේ ලැබූ උපකරණ වෙනුවෙන් රේගු නිෂ්කාෂණ ගාස්තු ගෙවීම	115.00	114.82	99	100
4.4	ඉදිකිරීම් වෙනුවෙන් VAT ගාස්තු ගෙවීම	31.00	16.285	53	100
	එකතුව	2762.139	2470.172	89	


*2022 වර්ෂයේ වෙන්කල මුදලින් තැන්පත් ගිණුමේ ඉතිරි මුදල

1.7.1 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

ව්‍යාපෘතියේ නම	අරමුදල් ලබා දෙන නියෝජිත ආයතනය	ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල (මිලියන)	ව්‍යාපෘති කාල සීමාව	ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සංරචක
ශ්‍රී ලංකාවේ කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලාවල ධාරිතා වර්ධන ව්‍යාපෘතිය (මරදාන,රත්නපුර තාක්ෂණ විද්‍යාල හා මාතර,රත්මලාන කාර්මික විද්‍යාල)	කොරියා ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA)	ඇ.ඩො. මි. 04	2021-2024	➢ ඉගෙනුම් අත්පොත් සකස් කිරීම. ➢ පුහුණුකරුවන්ගේ ධාරිතාව ගොඩනැගීම. ➢ රැකියාගත පුහුණුව ප්‍රවර්ධනය කිරීම. ➢ පුහුණු උපකරණ සැපයීම. ➢ පවතින වැඩහල් ප්‍රතිනිර්මාණය කිරීම. (CAD Lab, Manual Drawing room & Industrial Plumbing workshop)

තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාලවල පිහිටීම

පළාත	තාක්ෂණ/කාර්මික විද්‍යාලය
බස්නාහිර	ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය කොළඹ (මරදාන)
	කාර්මික විද්‍යාලය - ගම්පහ
	කාර්මික විද්‍යාලය - හෝමාගම
	කාර්මික විද්‍යාලය - කළුතර
	කාර්මික විද්‍යාලය - රත්මලාන
දකුණ	තාක්ෂණ විද්‍යාලය - ගාල්ල
	කාර්මික විද්‍යාලය - බලපිටිය
	කාර්මික විද්‍යාලය - බෙලිඅත්ත
	කාර්මික විද්‍යාලය - මාතර
	කාර්මික විද්‍යාලය - වීරවිල
සබරගමුව	තාක්ෂණ විද්‍යාලය - රත්නපුර
	කාර්මික විද්‍යාලය - ඇඹිලිපිටිය
	කාර්මික විද්‍යාලය - කෑගල්ල
	කාර්මික විද්‍යාලය - වරකාපොල
ඌව	තාක්ෂණ විද්‍යාලය - බදුල්ල
	කාර්මික විද්‍යාලය - බණ්ඩාරවෙල
	කාර්මික විද්‍යාලය - මැදගම
	කාර්මික විද්‍යාලය - මොණරාගල
නැගෙනහිර	තාක්ෂණ විද්‍යාලය - අම්පාර
	කාර්මික විද්‍යාලය - අක්කරපත්තුව
	කාර්මික විද්‍යාලය - මඩකලපුව
	කාර්මික විද්‍යාලය - දෙහිඅත්තකණ්ඩිය
	කාර්මික විද්‍යාලය - සමන්තුරේ
	කාර්මික විද්‍යාලය - ත්‍රිකුණාමලය
මධ්‍යම	තාක්ෂණ විද්‍යාලය - මහනුවර
	කාර්මික විද්‍යාලය - දඹුල්ල
	කාර්මික විද්‍යාලය - හසලක
	කාර්මික විද්‍යාලය - මාතලේ
	කාර්මික විද්‍යාලය - නුවරඑළිය
	කාර්මික විද්‍යාලය - පාතදුම්බර
උතුරු මැද	තාක්ෂණ විද්‍යාලය - අනුරාධපුර
	කාර්මික විද්‍යාලය - ප්ලොන්නරුව
වයඹ	තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල
	කාර්මික විද්‍යාලය - ආණමඩුව
	කාර්මික විද්‍යාලය - කුලියාපිටිය
	කාර්මිකවිද්‍යාලය-වාරියපොල
උතුරු	තාක්ෂණ විද්‍යාලය - යාපනය
	කාර්මික විද්‍යාලය - වවුනියාව
	කාර්මික විද්‍යාලය - මන්නාරම



2 වන පරිච්ඡේදය

ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 ප්‍රගතිය සහ ජයග්‍රහණ

කර්මාන්ත අංශයේ ක්ෂේත්‍ර 17 ක් යටතේ පවත්වන ලද පාඨමාලා 121 ක් සඳහා තාක්ෂණ විද්‍යාල 09 සහ කාර්මික විද්‍යාල 30 සඳහා 2023 දෙසැම්බර් 31 වන විට සිසුන් 24,291**ක්** බඳවාගෙන ඇත. පෙර වසරවල බඳවාගත් සිසුන් 8,269 හා 13 වසර වැඩසටහන යටතේ බඳවාගත් සිසුන් 678 සමඟ 2023 වර්ෂයේදී විද්‍යාල 39 හි සිසුන් 33,238 පුහුණුව ලබා ඇත. පුහුණුව ලැබූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 42% ක ප්‍රතිශතයක් කාන්තාවන් නියෝජනය කර ඇත.

අංකය	ක්ෂේත්‍රයේ නම	2023 වර්ෂයේ සිසුන් බඳවා ගැනීම්	පෙර වසරවල සිසුන් බඳවා ගැනීම්	13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ බඳවා ගැනීම්	මුළු ශිෂ්‍ය බඳවා ගැනීම්
1	කෘෂිකාර්මික, වැවිලි සහ පශු සම්පත්	1954	904	43	2901
2	මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව	4589	1651	261	6501
3	ගොඩනැගිලි ඉදිකිරීම	4444	3036	70	7550
4	විදුලි, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ	2431	1231		3662
5	මූල්‍ය බැංකුකරණය සහ කළමනාකරණය	1312	381		1693
6	ආහාර තාක්ෂණය	211	110		321
7	මැණික් සහ ස්වර්ණාභරණ	52	19		71
8	හෝටල් සහ සංචාරක	841	0	19	860
9	තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය තාක්ෂණය	3339	516	155	4010
10	භාෂා	1571	98		1669
11	සම් භාණ්ඩ සහ පාවහන්	51	0		51
12	මෙකාට්‍රොනික් තාක්ෂණය	200	201		401
13	ලෝහ සහ සැහැල්ලු ඉංජිනේරු විද්‍යාව	1448	97	34	1579
14	කාර්යාල කළමනාකරණය	680	0		680
15	ශීතකරණ සහ වායු සමීකරණය	709	35	17	761
16	රෙදිපිළි සහ ඇඟලුම්	328	0	10	338
17	දැව කර්මාන්තය	131	0	2	133
	මුළු එකතුව	**24291**	**8269**	**678**	**33238**

- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන ලද වෘත්තීය විෂයධාරා 26 ක් යටතේ පාඨමාලා 30 ක් සඳහා කාර්මික විද්‍යාල 29 ක සිසුන් 678 ක් පුහුණුව ලබා ඇත.

- සියලු ජන වාර්ගික කණ්ඩායම් නියෝජනය වන පරිදි තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 තුළ පුහුණු අවස්ථා පහසු කිරීම වෙනුවෙන් සිංහල මාධ්‍ය පාඨමාලා 90, දෙමළ මාධ්‍ය පාඨමාලා 59 සහ ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලා 47 ක් ලෙස පාඨමාලා 196ක් පවත්වන ලදී.

- බේකරි සහ ඉවුම් පිහුම්, මැහුම්, බතික්, කෘෂි නිෂ්පාදන තාක්ෂණය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ලේකම් පරිචය, යතුරු ලියනය වැනි වැඩි කාන්තා නැඹුරුවක් සහිත පාඨමාලා පවත්වනු ලබන තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල පන්තිකාමර සහ වැඩහල් පහසුකම් පුළුල් කරන ලදී. මේ වන විට වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ කාන්තා නියෝජනය 42% කට වැඩි ප්‍රතිශතයක් දක්වා වර්ධනය වී ඇති අතර ටෙලරින්, සම්භාණ්ඩ නිෂ්පාදනය, කෘෂිකාර්මික පාඨමාලා සඳහා 80% කට වැඩි ප්‍රතිශතයක් කාන්තා නියෝජනය පැවතුණි.

- NVQ 3, 4 පූර්ණ හා අර්ධ කාලීන පාඨමාලා සඳහා සිසුන් 18,670 ද NVQ 5 ,6 පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා සඳහා සිසුන් 3,909 ද සහතිකපත්‍ර පාඨමාලා සඳහා සිසුන් 1,712 ද වශයෙන් මුළු සිසුන් 24,291ක් පුහුණු කර ඇත.

- වෘත්තීය අධ්‍යාපනය ඉහල නැංවීම හා විද්‍යාලවලට බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය වැඩිකිරීම අරමුණු කරගනිමින් රාජ්‍ය හා පෞද්ගලික අංශ සමග අවබෝධතා ගිවිසුම් 5ක් අත්සන් කරන ලදි. ඒ යටතේ Gamma Pizza Kraft Lanka (pvt) Ltd, සේවා ලංකා පදනම හා දෙපාර්තමේන්තුව අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමට අනුව පළමුවන අදියර යටතේ අනුරාධපුරය, මහනුවර යන තාක්ෂණ විද්‍යාල වල හා කුලියාපිටිය, නුවර එළිය යන කාර්මික විද්‍යාල වල ක්ෂණික සේවා අවන්හල් (QSR) NVQ 4 පාඨමාලාව ආරම්භ කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කල පුහුණු ඒකක ස්ථාපනය කර පුහුණු පාඨමාලාව ආරම්භ කර ඇත.

- කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ ක්ෂණික සේවා අවන්හල් (QSR) NVQ 4 පාඨමාලාව හැදෑරූ පළමුවන කණ්ඩායමේ සිසුන් 21 දෙනෙක් පාඨමාලාව අවසන් කර සියළුදෙනා රැකියාගත වී ඇති අතර මේවන විට කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ සිසුන් 41 ක් ද නුවරඑළිය කාර්මික විද්‍යාලයේ සිසුන් 25ක් ද අනුරාධපුරය තාක්ෂණ විද්‍යාලයේ සිසුන් 24 ක් ද පුහුණුව ලබා ඇත.

- Alumex පෞද්ගලික ආයතනය හා දෙපාර්තමේන්තුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව ගාල්ල, මහනුවර යන තාක්ෂණ විද්‍යාල සහ මාතලේ, නුවරඑළිය, බණ්ඩාරවෙළ, රත්මලාන, කළුතර, බලපිටිය යන කාර්මික විද්‍යාල සඳහා නොමිලේ ඇළුමිනියම් පිළිසකරකරණ පාඨමාලාව සඳහා පුහුණු අමුද්‍රව්‍ය නොමිලේ ලබා දී ඇත.

- ටයිල් අතුරන්නන් (Tiler) 800ක් සඳහා RPL සහතික නිකුත් කිරීමේ අරමුණින් Dammika & Preshala පදනම සමග අවබෝධතා ගිවිසුමකට එළඹී අතර මරදාන තාක්ෂණ විද්‍යාලයේ පුහුණු ඒකකයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු එම පදනම හරහා සිදුකර අවසන්කර ඇති අතර පුහුණු කටයුතු ඉදිරියේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ පාඨමාලාව වැඩිදියුණු කිරීම සඳහා බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර ගැනීමේ අරමුණින් කර මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සමඟ පස් අවුරුදු අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර මරදාන, ගාල්ල, යාපනය යන තාක්ෂණ විද්‍යාල හා බෙලිඅත්ත, මඩකලපුව, යන කාර්මික විද්‍යාල වල පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර මේ වන විට මරදාන තාක්ෂණ විද්‍යාලයේ පූර්ණ කාලීන හා අර්ධකාලීන පාඨමාලා පවත්වන අතර පුහුණුව අවසන් කරන ලද ශිෂ්‍ය කණ්ඩායමක් රැකියාගත කිරීමේ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් සිදුකර ඇත.

- Southern Maritime Training Institute හා දෙපාර්තමේන්තුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කල අතර මරදාන තාක්ෂණ විද්‍යාලයේ නාවික ප්‍රවාහන කළමණාකරණය (Logistic Management) ක්ෂේත්‍රයේ පුහුණුව ලබන සිසුන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම හා නඩත්තු වියදම් කලමනාකරණය කර ගැනීමට බලාපොරොත්තු වේ.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 හරහා NVQ 3,4 මට්ටමේ සහතිකපත්‍ර 12,236 ද NVQ 5,6 මට්ටමේ සහතිකපත්‍ර 2,800ද NVQ නොවන සහතිකපත්‍ර 12,115ද ලෙස මුළු සහතික පත්‍ර 27,151ක් නිකුත් කර ඇත.

- 2021/2022 අධ්‍යයන වර්ෂවල NVQ 5 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා සහ NVQ 6 මට්ටමේ උසස් ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් 2,707 දෙනෙකුට 2023 නොවැම්බර් 14 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති උත්සවයේදී ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය කරන ලදී.

- මරදාන සහ බදුල්ල තාක්ෂණ විද්‍යාල මගින් හා රත්මලාන, මාතලේ, වාරියපොල, නුවර එළිය, කුලියාපිටිය සහ හෝමාගම යන කාර්මික විද්‍යාල මගින් වෙල්ඩින්, ජලනල තාක්ෂණය, ඇලුමිනියම් පිළිසකරකරණය, මෝටර්රථ තාක්ෂණය, වඩු කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, තොරතුරු තාක්ෂණය, කළමණාකරණ සහ ශීතකරණ හා වායුසමීකරණ යන ක්ෂේත්‍ර 12 ක් සඳහා පෙර ඉගෙනුම් ඇගයීම (RPL) සහතික පත්‍ර 748ක් නිකුත් කර ඇත. මීට අමතරව ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය මගින් සිදු කරනු ලබන පෙර ඉගෙනුම් ඇගයීම (RPL) සඳහා අවශ්‍ය වැඩහල් පහසුකම් තාක්ෂණ හා කාර්මික විද්‍යාල මගින් සපයා ඇත.

- විදේශ රැකියා වෙළඳපල ඉලක්ක කරගත් පාඨමාලා වන කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණය සහ පටක රෝපණ තාක්ෂණය පාඨමාලා සඳහා සිසුන් 1203ද ඇලුමිනියම් පිළිසකරණය පාඨමාලාව සඳහා සිසුන් 697ද වෙල්ඩින් තාක්ෂණය පාඨමාලාව සඳහා සිසුන් 926ද බේකරි සහ සූපශාස්ත්‍රය පාඨමාලාව සඳහා සිසුන් 523ද යන්ත්‍රණය පාඨමාලාව සඳහා සිසුන් 414ද කොරියන් භාෂාව සඳහා සිසුන් 102ද ලෙස සිසුන් පුහුණු කරන ලදී.

- ශිෂ්‍ය සුභසාධන වැඩසටහන යටතේ ශිෂ්‍යයන් සඳහා රුපියල් මිලියන 62.84 ක දුම්රිය වාරප්‍රවේශපත්‍රද නිපුණතා සිසු සවිය ශිෂ්‍යත්ව ආධාර වැඩසටහන යටතේ සුදුසුකම් ලැබූ සිසුන් 3000ක් සඳහා රුපියල් මිලියන 115.398 වටිනාකමනකින් යුතු ශිෂ්‍යාධාර ලබා දී ඇති අතර, අමාත්‍යාංශය මගින් ලබා දෙන ලද ආරක්ෂක ඇඳුම් කට්ටල 850ක් තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල කර්මික අංශයේ පාඨමාලා හදාරණ සිසුන් වෙත බෙදා දී ඇත.

- 2021 අය වැය යෝජනා යටතේ ටෙක් උදාන වැඩසටහන මගින් තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල පුහුණු ධාරිතාව වැඩිකිරීම හා ආකර්ශණීය පුහුණු මධ්‍යස්ථාන ලෙස ඒකීය වාස්තු විද්‍යාත්මක සැලැස්මකට අනුව නවීකරණ කටයුතු ආරම්භ කල කුරුණෑගල තාක්ෂණ විද්‍යාලයේ නවීකරණ කටයුතු 50% ක්ද මහනුවර තාක්ෂණ විද්‍යාලයේ නවීකරණ කටයුතු 70% ක්ද වශයෙන් හා හෝමාගම කාර්මික විද්‍යාලයේ නවීකරණ කටයුතු 90%ද හා දඹුල්ල කාර්මික විද්‍යාලයේ 80% ක් ලෙස භෞතික ප්‍රගතිය අත්පත් කර ඇති අතර දෙපාර්තමේන්තුව හරහා නාවික හමුදා ශ්‍රම දායකත්වය යටතේ නවීකරණය කරනු ලබන මරදාන තාක්ෂණ විද්‍යාලයේ නවීකරණ කටයුතු 35% හා මාතර කාර්මික විද්‍යාලයේ නවීකරණ කටයුතු 70%ක් ලෙස අවසන් කර ඇත.

- කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය සහ දෙපාර්තමේන්තුව අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලාවල ධාරිතා වර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රතිලාභී විද්‍යාලවන මරදාන, රත්නපුර, රත්මලාන, මාතර යන තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල ජලනල තාක්ෂණ වැඩහල් හා සැලසුම්ශිල්පී හා පරිසණක ආශ්‍රිත සැලසුම්කරණ විද්‍යාගාර ප්‍රතිනිර්මාණය කිරීම් කටයුතු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ අතර යෝජිත වැඩ කොටස් සියල්ල අවසන් කර ඇත. 2023 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සමස්ථ වියදම ලෙස මිලියන 154.89 වැය කර ඇත.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රතිලාභී විද්‍යාලවන මරදාන, රත්නපුර, රත්මලාන, මාතර යන තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල වැඩිදියුණු කල කාර්මික ජලනල තාක්ෂණ වැඩහල, (Industrial Plumbing) පරිගණක ආශ්‍රිත සැලසුම්කරණ තාක්ෂණ විද්‍යාගාරය (Drafting Technology) හා සැලසුම්ශිල්පී විද්‍යාගාරය සඳහා (Draughtmanship) නවීන වැඩහල් උපකරණ, පරිගණක හා මෘදුකාංග, පුහුණු උපකරණ හා ලී බඩු උපකරණ සියල්ල

කොරියානු රජය මගින් ප්‍රදානය කළ අතර සියලු උපකරණ සවිකර පූර්ණ පහසුකම් සහිත වැඩහල් හා විද්‍යාගාර සිසුන්ගේ පුහුණු කටයුතු සඳහා යොදා ගැනීමආරම්භ කර ඇත. පුහුණු උපකරණ වල වටිනාකම ආසන්න ලෙස රුපියල් මිලියන 300ක් පමණ වේ.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ කර්මාන්තගත පුහුණු සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රතිලාභී විද්‍යාල වල හා අනෙකුත් විද්‍යාලවල හා වෘත්තීය පුහුණු අධිකාරිය නියෝජනය කරමින් උපදේශකවරුන් 20 ක් සඳහා දින පහක පුහුණු කරුවන් පුහුණුකිරීමේ (ToT) වැඩසටහනක් පවත්වන ලදී.

- රැකියාගත පුහුණු නියමු වැඩසටහනක් පැවැත්වීම සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් 11 දෙනෙකු සහ රැකියාගත පුහුණුව ලැබීමට යෝජිත සිසුන් 17 දෙනෙකු සඳහා මූලික දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා සිසුන් සඳහා මසක කර්මාන්තගත නියමු වැඩසටහනක් පවත්වන ලදි. කර්මාන්තකරුවන් සඳහා පුහුණු පරිපාලනය වෙනුවෙන් දීමනාවක් KOICA ආයතනය විසින් ගෙවන ලද අතර, මාසික පුහුණුව සාර්ථකව අවසන් කල සිසුන් සඳහා KOICA ආයතනය මගින් සහතිකපත්‍ර පිරිනමන ලදි.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කාර්මික ජලනල තාක්ෂණය උපදේශකවරුන් හා ශිල්ප ප්‍රදර්ශකවරුන් 20ක් හා පරිගණක ආශ්‍රිත සැලසුම් ශිල්පය උපදේශකවරුන් 20ක් සඳහා කොරියානු මහාචාර්යවරුන් විසින් දින 35 ක නේවාසික පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මරදාන තාක්ෂණ විද්‍යාලයේ වැඩිදියුණු කල වැඩහල් හා විද්‍යාගාර භාවිතයෙන් පවත්වන ලදි. කොරියානු මහාචාර්යවරුන් විසින් සකස් කරනු ලැබූ ඉගෙනුම් අත්පොත් පුහුණුව සඳහා ලබා දෙන ලදි.

- 2013 – 2015 කාලපරිච්ඡේදයේදී මරදාන, මහනුවර, කෑගල්ල, බණ්ඩාරවෙල හා සමන්තුරය යන තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල කොරියානු ආධාර යටතේ වැඩිදියුණු කල මෝටර් කාර්මික වැඩහල් වලට අදාලව කොරියානු නියෝජිතයන් විසින් සිදුකල පශ්චාත් ඇගයීම් නිරීක්ෂණයන් පාදක කරගෙන ඇමරිකන් ඩොලර් 75,500 ක ප්‍රදානයන් හරහා එම වැඩහල් වල පශ්චාත් කලමණාකරන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අදාලව මූලික කටයුතු සැලසුම් කර වැඩ සැලැස්ම සඳහා KOICA ආයතනයේ අනුමැතිය ලබාගෙන ඇත.

- වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව පිළිබඳව තරුණ පරපුර දැනුවත් කිරීමේ අරමුණින් දෙරණ මාධ්‍ය ජාලය සමඟ එක්ව පවත්වනු ලබන " Derena Skill Force " ජාතික වැඩසටහන මරදාන, ගාල්ල යන තාක්ෂණ විද්‍යාල සහ ගම්පහ, ඇඹිලිපිටිය, නුවරඑළිය හා කළුතර යන කාර්මික විද්‍යාල වල පවත්වන ලද අතර ඒ ඒ ප්‍රදේශ වල සිසුන් 10,000ට ආසන්න ප්‍රමාණයක් මේ සඳහා ලියාපදිංචි වී ඇත.

- වෘත්තීය හා කාර්මික අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 224ක් පවත්වා තරුණ තරුණියන් 12,900ක් දැනුවත් කර ඇත.

- මරදාන, රත්නපුර යන තාක්ෂණ විද්‍යාල හා මාතර කාර්මික විද්‍යාලය සඳහා KOICA හා JICA ස්වේච්ඡා නිලධාරීන් අනුයුක්ත කර තොරතුරු තාක්ෂණය හා කොරියානු භාෂාව ඉගැන්වීම් කටයුතු සිදුකරමින් පවතී.

- ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ උපදේශකවරුන් 108ක් සඳහා පැය 100ක ධාරිතා වර්ධන පුහුණු වැඩසටහක් ශ්‍රී ලංකා පරිපාලන සංවර්ධන ආයතනය මගින් පවත්න ලදි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතාවයන් ප්‍රවර්ධනය සඳහා ජර්මානු රජයේ ඉදිකිරීම් නියෝජිත ආයතනයක් හා ඒකාබද්ධව ශ්‍රී ලංකා ඉදිකිරීම් සංසදය මගින් ජර්මානු පුහුණුකරුවන් හරහා වෙල්ඩින් තාක්ෂණය, ජලනල තාක්ෂණය හා Light weight Partitioning යන ක්ෂේත්‍ර වල දින 5 බැගින් පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර උපදේශකවරුන් 10ක් පුහුණු කරන ලදී.

- ලෝහ වැඩ හා මෝටර් කාර්මික, විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ශිල්ප ප්‍රදර්ශක තනතුරු පිරවීම සඳහා ශිල්ප ප්‍රදර්ශකවරුන් 13 දෙනෙකු බඳවාගෙන විද්‍යාලවලට අනුයුක්ත කර ඇත.

- ව්‍යක්තීය අධ්‍යාපනට හා පුහුණුව නිමකල සිසුන්ගේ රැකියාගත වීමේ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා දත්ත ඇතුලත් කිරීමට පහසුකම් (Link) සපයා ඇති අතර මේ වන විට පසුගිය වසර වල පාඨමාලා නිම කල සිසුන්ගේ රැකියා තොරතුරු ඇතුලත් කිරීම සිදුකරමින් පවතී. සමස්ථයක් ලෙස කාර්මික හා තාක්ෂණ විද්‍යාලවල පුහුණුව අවසන් කල සිසුන්ගේ රැකියාගත වීමේ ප්‍රතිශතය 70% ඉක්මවා ඇත.

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ වන තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 යෙහි ඉඩම් ප්‍රමාණය දල වශයෙන් අක්කර 468.25 වන අතර ඉන් විද්‍යාල 13 ක ඉඩම් අක්කර 82 ක් මේ වන විට දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමේ කටයුතු කර ඇත.

2.2 2024 වර්ෂය සඳහා ඉලක්ක සහ අනාගත දැක්ම

- 2024 වර්ෂය සඳහා තාක්ෂණ විද්‍යාල 09 සහ කාර්මික විද්‍යාල 30 හි කර්මාන්ත අංශ 18ක් යටතේ පාඨමාලා 141 ක් සඳහා සිසුන් 35,450 ක් බඳවා ගැනීමට සැලසුම් කර ඇත. මේ යටතේ NVQ 5 හා 6 ඩිප්ලෝමා පාඨමාලා 41ක් ද NVQ 3 හා 4 පාඨමාලා 100ක් ද ඇතුළුව විද්‍යාල 39 හි වැඩසටහන් 900ක් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

- විවිධ අධ්‍යාපන මට්ටම්වල සිටින පුද්ගලයන්හට ව්‍යක්තීය අධ්‍යාපන අවස්ථා විවර කරමින් සා.පෙළ අසමත් සිසුන් සඳහා පාඨමාලා 31ද සා.පෙළ සමත් සිසුන් සඳහා NVQ 3 මට්ටමේ පාඨමාලා 40 ද උසස්පෙළ සමත් සිසුන් සඳහා NVQ 5 / 6 මට්ටමේ පාඨමාලා 48ද ආරම්භ කිරීමට නියමිතය. තොරතුරු තාක්ෂණය, ජාතික තාක්ෂණ සහතික පාඨමාලා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පාඨමාලා හා ඉංග්‍රීසි යන පාඨමාලා 25ක් මාර්ගගත හා මිශ්‍ර අධ්‍යාපන ක්‍රමවේදය යටතේ පැවැත්වීමට සැලසුම් කර ඇත.

- වායු හා වාප පෑස්සුම් තාක්ෂණය, මෝටර්රථ පින්තාරු කිරීම, ඇලුමිනියම් පිළිසකරකරණය, මෝටර් රථ වායුසමීකරණය, සූර්ය පද්ධති කාර්මික ශිල්පය, විදුලි කාර්මික ශිල්පය, ජලනල තාක්ෂණය, මෝටරථ විදුලි කාර්මික ශිල්පය, පටක රෝපණ තාක්ෂණ සහකාර වැනි කර්මාන්ත ක්ෂේත්‍ර වල වැඩි ඉල්ලුමක් ඇති NVQ 3,4 මට්ටමේ පාඨමාලා සඳහා විද්‍යාලවල වැඩහල් පහසුකම් වැඩිදියුණු කිරීමෙන් සිසුන් 1000 ක් පමණ වැඩිපුර බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

- කොරියානු ආධාර යටතේ ක්‍රියාත්මක ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතියේ වැඩහල් නවීකරණය වෙනුවෙන් අනුමත අරමුදලින් ඉතිරි වූ මුදල් යොදාගෙන රත්නපුර, මාතර හා රත්මලාන ප්‍රතිලාභී විද්‍යාලවල ජලනල පන්තිකාමර නවීකරණය කිරීමටත් මරදාන තාක්ෂණ විද්‍යාලයේ කුලසිංහ ගොඩනැගිල්ලේ පන්ති කාමර හා සනීපාරක්ෂක පහසුකම් හා හඳුනාගත් අමතර වැඩකොටස් නිමකිරීමටත් සැලසුම්කර ඇත.
- කොරියානු ආධාර යටතේ ක්‍රියාත්මක ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය මඟින් වැඩිදියුණු කල පහසුකම් යටතේ මරදාන, රත්නපුර, මාතර හා රත්මලාන යන ප්‍රතිලාභී විද්‍යාල වල පරිගණක ආශ්‍රිත සැලසුම් ශිල්පය Drafting Technology (NVQ 05) පාඨමාලාව සඳහා සිසුන් 100 දෙනෙකු හා කර්මාන්ත ජලනල තාක්ෂණ පාඨමාලාව (Industrial Plumbing - NVQ 04) සඳහා සිසුන් 200 දෙනෙකු වර්ෂිකව පුහුණු කිරීමට සැලසුම් කර ඇත.

- කර්මාන්ත ක්ෂේත්‍රයේ වැඩි ඉල්ලුමක් පවතින පාඨමාලා 16 හඳුන්වා දීමට අපේක්ෂා කරන අතර, විදේශ රැකියා වෙළඳපොළට ගැලපෙන පරිදි ජලනල තාක්ෂණය, මෙකාට්‍රොනික්, සයිබර් ආරක්ෂිත තාක්ෂණය සහ වායු හා වාප පෑස්සුම් වැනි පාඨමාලා හා කාන්තා නැඹුරු පාඨමාලා වන බේකරි සහ සූපවේදය, බතික්, මැහුම්, කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය, ලේකම් පරිචය, පරිසණක තොරතුරු තාක්ෂණය, යතුරුලියනය හා ලඝුලේඛණ පාඨමාලා පුළුල් කිරීමටත් සැලසුම් කර ඇත

- වර්තමානයේ පවතින දේශීය හා විදේශීය අංශයේ රැකියා ඉල්ලුමට සරිලන පරිදි විද්‍යාල 11 ක Care Giver (සත්කාරක සේවා) හා Nurse Assistant (හෙද සහායක) පාඨමාලා අළුතින් ආරම්භ කර සිසුන් 1360 ක් බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

- හෝටල් හා සංචාර ක්ෂේත්‍රයේ පාඨමාලා පුළුල් කිරීමේ අරමුණින් පීසා හට් (Pizza Hut) සමාජ සත්කාරක මූල්‍යමය අරමුදල් යොදා ගනිමින් හඳුනාගත් විද්‍යාල 5 ක ක්ෂණික සේවා අවන්හල් (QSR) ආරම්භ කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර පුහුණු උපකරණ මිලදී ගැනීමට කටයුතු සැලසුම් කර ඇත. පුහුණුව අවසන් කරන සිසුන් පීසා හට් ආපනශාලා ජාලයේ සාමාජිකයන් ලෙස බඳවා ගැනීමට සැලසුම් කර ඇත. ඊට අමතරව පේස්ට්‍රි, බේකරි හා සූපවේදය පාඨමාලා වලට විද්‍යාල කිහිපයක් දක්වා පුළුල් කිරීමටත් සැලසුම් කර ඇත.

- උසස්පෙළ තාක්ෂණ විෂයධාරාව හදාරන පාසැල් සිසුන් 1000ක් ආවරණය වන පරිදි තාක්ෂණ හා කාර්මික විද්‍යාලවල වැඩහල් සහ විද්‍යාගාර තුළ ප්‍රායෝගික පුහුණු අවස්ථා ලබාදීමට සැලසුම් කර ඇත

- 2023 වර්ෂයේදී පුහුණුව අවසන් කරන සිසුන් සඳහා NVQ 3, 4 සහතිකපත් 8,300ක්, NVQ 5, 6 සහතිකපත් 1,600 ක් සහ දෙපාර්තමේන්තු සහතික පත්‍ර පාඨමාලා සඳහා සහතික 12,900ක් ඇතුළුව සහතික පත්‍ර 22,800 ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇති අතර, RPL සහතික පත්‍ර 3000 ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

- 2021 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ආරම්භ කල ටෙක් උදාන සංවර්ධන වැඩසටහන යටතේ මරදාන තාක්ෂණ විද්‍යාලය සහ මාතර යන කාර්මික විද්‍යාලය වඩාත් ආකර්ශනීය පුහුණු මධ්‍යස්ථාන බවට පත් කිරීම සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන 25 ක මුදලින් ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිලදීගෙන ශ්‍රී ලංකා නාවික හමුදා ශ්‍රම දායකත්වය යටතේ නවීකරණ කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත.

- තාක්ෂණ විද්‍යාලවල විදුලි පරිභෝජන පිරිවැය අවම කිරීමේ අරමුණින් රුපියල් මිලියන 40ක වියදමකින් යුතුව අනුරාධපුර, අම්පාර, යාපනය සහ මරදාන යන තාක්ෂණ විද්‍යාලවල සඳහා සූර්යපැනල පද්ධති සවි කිරීමට සැලසුම් කර ඇත.

- 2024 අයවැය මඟින් කාර්මික විද්‍යාල නවීකරණය සඳහා වෙන් වූ ප්‍රතිපාදන උපයෝගී කරගෙන බලපිටිය කාර්මික විද්‍යාලයේ පංතිකාමර නවීකරණය,කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ වෙල්ඩින් මෝටර්ථ තාක්ෂණ පාඨමාලා පවත්වන ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අමුද්‍රව්‍ය මිලදී ගැනීමටත්, මඩකලපුව කාර්මික විද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ වහලය ප්‍රතිසංස්කරණය කිරීම සහ ආනමඩුව කාර්මික විද්‍යාලයේ බේකරි සහ කුකරි පාඨමාලා සඳහාවූ මුළුතැන්ගෙය නවීකරණය කිරීමටත් සැලසුම් කර ඇත.

- 2024 අයවැය යටතේ තාක්ෂණ විද්‍යාල සඳහා වෙන්වූ ප්‍රතිපාදන මඟින් අම්පාර තාක්ෂණ විද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කිරීමටත් ගාල්ල,රත්නපුර, බදුල්ල,කුරුණෑගල,යාපනය,අනුරාධපුර හා මරදාන තාක්ෂණ විද්‍යාලවල වැඩහල් සහ පංති කාමර ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.

- Art of Living පදනම මඟින් සමාජ සත්කාරක වැඩසටහනක් ලෙස හඳුනාගත් විද්‍යාල 11ක විදුලි වැඩහල් යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු සැලසුම් කර ඇත. මෙහි පළමු අදියර යටතේ විද්‍යාල 7ක වැඩහල් යාවත්කාලීන කිරීම සඳහාවන යටිතල පහසුකම් සංවර්ධන කර පුහුණු උපකරණ ලබා දීමට එකඟ වී ඇති අතර උපදේශකවරුන් සඳහා සති දෙකක පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීමටද සැලසුම් කර ඇත.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල සඳහා 2024 වසරට සිසුන් බඳවා ගැනීම වැඩිකිරීම සඳහා ඉලක්ක කණ්ඩායම් වෙත වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 1,536 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන නියෝජිතයන්, පෞද්ගලික අංශය හා ඒකාබද්ධව සිදු කරනු ඇත.

- අධ්‍යයන සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා ඉදිකිරීම්, මෝටර් රථ තාක්ෂණය, දැව කර්මාන්තය, ශීතකරණ හා වායුසමීකරණ, කාර්මික චිත්‍රකරණය, විදුලි හා ඉලෙක්ට්‍රොනික්, තොරතුරු තාක්ෂණය, ලෝහ වැඩ, කෘෂිකර්මාන්තය යන ක්ෂේත්‍රයන් සඳහා උපදේශකවරුන් 200 දෙනෙකු බඳවා ගැනීමටත් ශිල්ප ප්‍රදර්ශක තනතුරු 115 ක පුරප්පාඩු පිරවීමටත් සැලසුම් කර ඇත.

2.3 වෘත්තීය අධ්‍යාපනයේ අභියෝග

- වෘත්තීය අධ්‍යයන ක්ෂේත්‍රයේ සංවර්ධනය වෙනුවෙන් අයවැය මඟින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන සීමා වීම තුළින් වෘත්තීය අධ්‍යාපන ආයතනවල නඩත්තු වියදම් කලමනාකරණය කර ගැනීම අපහසු වීම හා ශිෂ්‍ය සුභසාධන පහසුකම් ලබා දීමේ ගැටළුකාරී තත්වය හමුවේ සිසුන් පාඨමාලා හැරයාමේ ප්‍රවනතාවක් දක්නට ලැබීම.

- පවතින සමාජ ආර්ථික බලපෑම හේතුවෙන් වෘත්තීය අධ්‍යාපනයේ ඉලක්ක තරුණ කණ්ඩායම නිපුණතාවයක් රහිත අඩු වැටුප් සහිත රැකියාවලට නැඹුරු වීමේ ප්‍රවනතාවය තුළ පාඨමාලා සඳහා යොමුවන ප්‍රමාණය අඩු වීම.

- සාමාජීය ආකල්ප වල බලපෑම හේතුවෙන් වෙල්ඩින්, පෙදරේරු, ලී වැඩ වැනි පාඨමාලා සඳහා අඩු ශිෂ්‍ය ආකර්ෂණයක් පැවතීම හා වෘත්තීය පාඨමාලා සඳහා වූ අඩු කාන්තා නැඹුරුතාවය.

- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා පාඨමාලා පැවැත්වීමට බොහෝ විද්‍යාල වල සුදුසු යටිතල පහසුකම් හා එම පුද්ගලයින්ට විශේෂිත වූ පාඨමාලා අවම වීම.


- පාසැල් අධ්‍යාපන පද්ධතියට අදාළව ජාතික මට්ටමේ විභාග (සා.පෙළ සහ උ.පෙළ) පැවැත්වීමේ කාල රාමුව වෙනස්වීම තුල පාඨමාලාවන් සඳහා සිසුන් බඳවා ගැනීමේ කාල රාමුව නොගැලපීම තුලින් ශිෂ්‍ය බඳවා ගැනීම් අඩුවීම.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු දීර්ඝ කාලීනව නොපිරවීම මඟින් කාර්මික අධ්‍යාපනයේ ගුණාත්මක භාවයට සෘජුවම අහිතකර ලෙස බල

3 වන පරිච්ඡේදය

වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය




කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව — ඒසිඒ-එල්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු.		සටහන	තක්සා 2023 රු.	2022 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,220,180,712	2,126,600,000	ඒසිඒ-3
-	නැන්පතු		195,958,187	122,458,485	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		48,994,470	49,035,304	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**2,465,133,369**	2,298,093,789	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**2,465,133,369**	2,298,093,789	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	22,389,241	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		2,465,133,369	2,275,704,548	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,911,750,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,785,406,459	1,852,603,617	
330,949,890	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	315,796,281	234,139,453	ඒසිඒ-2(ii)
72,871,669	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	70,980,752	61,984,606	
-	පොළී ගෙවීම්	8	-	-	
289,691	වෙනත් පුනරාවර්තන වියදම්	9	289,691	148,835	
2,315,861,250	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**2,172,473,183**	2,148,876,511	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
79,500,000	වැඩිදියුණු කිරීම්	10	18,732,309	26,480,478	
39,138,750	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	23,134,813	7,334,749	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
2,500,000	හැකියා වර්ධනය	14	620,180	698,425	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
121,138,750	මුළු මූලධන වියදම් (උ)		**42,487,302**	34,513,652	
	නැන්පතු ගෙවීම්		245,281,367	125,475,446	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		37,184,771	28,190,299	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		282,466,138	153,665,745	
2,437,000,000	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		2,497,426,623	2,337,055,908	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(32,293,254)	(61,351,360)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		32,293,254	61,351,360	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය



කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව ඒසිඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කන්‍ය 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	9,205,912,746	8,526,577,933
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	81,172,335	92,982,034
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**9,287,085,081**	**8,619,559,967**
ශුද්ධ වත්කම් / ඇකන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		24,798,522	(12,714,959)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		9,205,912,746	8,526,577,933
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රාග්ම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	56,373,813	105,696,993
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**9,287,085,081**	**8,619,559,967**

පිටු අංක 7 සිට 77 දක්වා ඒසිඒ 2 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 78 සිට 125 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරවී කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම් :
තනතුර :
දිනය :2024/02/27

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
පැලවත්ත, බත්තරමුල්ල


.....
ගණන්දීමේ නිලධාරි
නම් :
තනතුර :
දිනය :2024/02/26

S.C. Jagath
Director General
Department of Technical Education & Training
P.O. Box : 557, Olcott Mawatha, Colombo 10.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම් :
දිනය :2024/02/26

බී.ඒ.පී.ඩී. චිත්‍රානන්ද බමුණුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ඔල්කට් මාවත, කොළඹ 10.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය



ඒසිඒ-සී

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	150,924,115	133,190,187
අග්‍රිම ලැබීම්	2,220,180,712	2,126,600,000
අත්තිකාරම් අයකර ගැනීම්	54,709,626	50,651,499
තැන්පතු ලැබීම්	195,958,187	122,458,485
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	2,621,772,640	2,432,900,171
අඩුකළා : මුදල් වැය කිරීම්		
සුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,087,523,850	2,075,363,757
සහනාධාර සහ මාරුකිරීම්	70,980,752	62,133,441
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	138,169,895	85,039,424
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	22,389,241
අත්තිකාරම් ගෙවීම්	37,329,475	27,985,210
තැන්පතු ගෙවීම්	245,281,367	125,475,446
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	2,579,285,339	2,398,386,519
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	42,487,301	34,513,652
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භෞතික වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	42,487,301	34,513,652
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	42,487,301	34,513,652
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(42,487,301)	(34,513,652)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාළ නැත

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගීකර ගැනීමේ කාර්යසාධනය

වියදම් ශීර්ෂ	වර්ෂය සඳහා වෙන් කල ප්‍රතිපාදන (රු.මිලි)	වියදම 2023 දෙසැම්බර් 31 දක්වා (රු.මිලි)	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
ප්‍රාග්ධන වියදම්	**121.137**	**42.768**	**35**	**85**
ගොඩනැගිලි හා ඉදිකිරීම්	53.000	7.087	13	30
යන්ත්‍රසූත්‍ර හා උපරකරණ මිලදී ගැනීම	22.000	17.605	80	90
ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම	17.000	5.526	32	55
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව	18.500	10.403	56	70
වාහන අළුත්වැඩියාව	8.000	1.527	19	25
මානව සම්පත් සංවර්ධනය	2.500	0.620	0.5	20
පුනරාවර්තන වියදම්	**2316.000**	**2160.868**	**93**	**100**
විදේශීය අරමුදල්	**159.500**	**108.728**	**68**	**100**

3.6.1 ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා වල ධාරිතා වර්ධනය සඳහා කොරියානු ආධාර ව්‍යාපෘතිය (KOICA)

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (**KOICA**) මඟින් ලබා දෙන ඇමරිකානු ඩොලර් මිලියන 4ක වටිනාකමින් යුතු ප්‍රදානයක් හරහා ක්‍රියාත්මක වන තෝරාගත් තාක්ෂණ හා කාර්මික විද්‍යාල 4 ක ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලාවල ධාරිතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 - 2024 කාල රාමුව තුළ ක්‍රියාත්මකවේ. ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ඉදිකිරීම් අංශයේ පාඨමාලා සංවර්ධනය කිරීම තුලින් ශ්‍රී ලංකාවේ පුහුණු ශ්‍රමිකයන්ගෙන් වැඩි ප්‍රතිශතයකින් ඉදිකිරීම් අංශයේ ශ්‍රම බලකාය වැඩිකිරීමත් විදේශීය ශ්‍රම වෙළඳපොළ සඳහා පුහුණු ශ්‍රමිකයින් බිහිකිරීමත්වේ.

2023 වර්ෂයේ දෙසැම්බර් 31 වන දින වන විට ව්‍යාපෘතිය මගින් මරදාන හා රත්නපුර තාක්ෂණ විද්‍යාලවල හා රත්මලාන හා මාතර කාර්මික විද්‍යාලවල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලා වලට අදාලව වැඩහල් නවීකරණය කිරීම ,විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම,ගුරුවරුන් පුහුණු කිරීම , පුහුණු උපකරණ ලබා දීම හා රැකියාගත පුහුණු උපායමාර්ග සකස් කිරීම යන ව්‍යාපෘති සංරචක සියල්ල ක්‍රියාත්මක කල අතර සමස්ථ ව්‍යාපෘතියේ කටයුතු 75% ක ප්‍රමාණයක් අවසන් කර ඇත.

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය සහ දෙපාර්තමේන්තුව අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව වැඩහල් ප්‍රතිනිර්මාණය කිරීම් කටයුතු කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කළ අතර යෝජිත වැඩ කොටස් සියල්ල අවසන් කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු

සඳහා ඇස්තමේන්තුගත මුදල ලෙස රු.මි.205.037 ක් අනුමත කරන ලදී . 2023 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සමස්ථ වියදම ලෙස මිලියන 154.89 වැය වී ඇත. (2023.12.31 දිනට භෞතික හා මුල්‍ය ප්‍රගතිය පහත වගුවෙන් පෙන්වා ඇත)

ප්‍රතිලාභී විද්‍යාලවන මරදාන හා රත්නපුර තාක්ෂණ විද්‍යාලවල හා මාතර හා රත්මලාන කාර්මික විද්‍යාලවල වැඩිදියුණු කල කාර්මික ජලනල තාක්ෂණ වැඩහල්, පරිගණක ආශ්‍රිත සැලසුම්කරණ විද්‍යාගාර හා සැලසුම් ශිල්පී විද්‍යාගාර සඳහා නවීන වැඩහල් උපකරණ,පරිගණක හා මෘදුකාංග, පුහුණු උපකරණ හා අමුද්‍රව්‍ය , ලී බඩු උපකරණ සියල්ල කොරියානු රජය මඟින් ප්‍රදානය කල අතර සියළු උපකරණ සවිකර පූර්ණ පහසුකම් සහිත වැඩහල් හා විද්‍යාගාර සිසුන්ගේ පුහුණු කටයුතු සඳහා යොදාගැනීම ආරම්භකර ඇත.පුහුණු උපකරණ වල වටිනාකම ආසන්න වශයෙන් රුපියල් මිලියන 300 ක් පමණ වේ.

ප්‍රතිලාභී විද්‍යාල 4 හි හා අනෙකුත් විද්‍යාලවල ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුහුණු උපදේශකවරුන් හා ශිල්ප ප්‍රදර්ශකවරුන් 40 දෙනෙකු සඳහා කොරියානු විශේෂඥවරුන් විසින් යාවත්කාලීනව සකස් කරන ලද, පරිගණක ආශ්‍රිත සැලසුම්කරණය (CAD) , සැලසුම් ශිල්පය (Draughtmanship) සහ කාර්මික ජලනල (Industrial Plumbing) පාඨමාලාවල අන්තර්ගතයන් පිළිබඳව දින 35 ක පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන මරදාන තාක්ෂණ විද්‍යාලයේ වැඩිදියුණු කල විද්‍යාගාර හා වැඩහල් භාවිතා කරමින් කොරියානු විශේෂඥයන් විසින් සිදුකරන ලදී. ඉගෙනුම් අත්පොත් මුද්‍රණයකර පුහුණුකරුවන් සඳහා ලබා දෙන ලදී.

ඉදිකිරීම් කර්මාන්තය සඳහා රැකියා ගත පුහුණු (OJT) උපායමාර්ග තුලින් රැකියාගත පුහුණු ක්‍රමවේදය ප්‍රවර්ධනය කිරීම සඳහා දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සම්පත් දායකයින්ද යොදාගෙන කොරියානු විශේෂඥයින් විසින් දින 5 ක පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) දෙවන වැඩමුළුව පවත්වන ලදී. ප්‍රතිලාභී විද්‍යාලවල හා වෘත්තීය පුහුණු අධිකාරියේ උපදේශකවරුන්, වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් ඇතුළුව නිලධාරීන් 20 දෙනෙකු මෙම වැඩසටහනේ ඉලක්කගත කණ්ඩායම විය. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් අතර රැකියාගත පුහුණු උපායමාර්ග ප්‍රචලිත කිරීමේ අරමුණින් තොරාගත් කර්මාන්ත 11 ක් සඳහා රැකියාගත පුහුණු පරිපාලනය සඳහා මූල්‍යමය සහාය ලබා දීම හා රැකියගත පුහුණු නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කර පුහුණුව සාර්ථකව අවසන් කර සිසුන් 17දෙනෙකු සඳහා සහතිකපත්‍ර ප්‍රදානයකරන ලදී.

ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා වල ධාරිතා වර්ධනය සඳහා කොරියානු ආධාර ව්‍යාපෘතිය යටතේ වැඩහල් නවීකරණය : 2023.12.31 දිනට භෞතික හා මුල්‍ය ප්‍රගතිය

ඒය අංකය	ප්‍රතිලාභී විද්‍යාලය	ක්‍රියාකාරකම	අනුමත ඇස්තමේන්තු මුදල (රු)	කොන්ත්‍රාත් මුදල (රු)	2023 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය (රු)	ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය (අරමුදල්) (රු)	2023.12.31 දිනට මුළු වියදම (රු)	මුළු සමුච්චිත වියදම (රු.)	මූල්‍ය ප්‍රගතිය %	භෞතික ප්‍රගතිය %
126 – 02 – 21 – 14 – 2509 (13) විදේශීය මූල්‍යනය	කා.වි. රත්මලාන	CAD විද්‍යාගාරය, කාර්මික චිත්‍රකාමරය (manual drawing room) හා කාර්මික ජලනල (Industrial plumbing) වැඩහල ප්‍රතිසංස්කරණය කිරීම	62,698,408.58	47,498,794.38	159,500,000.00	109,417,725.97	30,051,327.04	43,264,465.35	91%	100 % වැඩ අවසන්
	කා.වි. මාතර	CAD විද්‍යාගාරය, කාර්මික චිත්‍රකාමරය (manual drawing room) හා කාර්මික ජලනල (Industrial plumbing) වැඩහල ප්‍රතිසංස්කරණය කිරීම	46,620,034.56	37,873,079.00			29,911,616.41	39,560,578.81	100%	100 % වැඩ අවසන්
	තා.වි. රත්නපුර	CAD විද්‍යාගාරය, කාර්මික චිත්‍රකාමරය (manual drawing room) හා කාර්මික ජලනල (Industrial plumbing) වැඩහල ප්‍රතිසංස්කරණය කිරීම	54,646,664.89	41,398,988.55			21,154,421.11	38,025,680.99	92%	100 % වැඩ අවසන්
	තා.වි. මරදාන	CAD විද්‍යාගාරය, කාර්මික චිත්‍රකාමරය (manual drawing room) හා කාර්මික ජලනල (Industrial plumbing) වැඩහල ප්‍රතිසංස්කරණය කිරීම (අමුද්‍රව්‍ය මිලදී ගැනීම සහ පරිපාලන වියදම්)	25,105,283.81	25,105,283.81			18,151,416.62	22,079,760.15	93%	100 % වැඩ අවසන්
		CAD විද්‍යාගාරය, කාර්මික චිත්‍රකාමරය හි ලී වලින් සාදන ලද බිම (wooden floor) සැකසීම	15,966,720.00	12,096,000.00			9,460,065.64	11,960,065.64	84%	100 % වැඩ අවසන්
		එකතුව	**205,037,111.84**	**163,972,145.74**	**159,500,000.00**	**109,417,725.97**	**108,728,846.82**	**154,890,550.94**		
		VAT බදු ගාස්තු (25091 (17))					**16,285,925.52**	**18,027,437.92**		

3.7 මු.රෙ. 208 ප්‍රකාරව,අනෙකුත් ආයතන / දෙපාර්තමේන්තු විසින් දරණ ව්‍යදම්

දෙපාර්තමේන්තු ශීර්ෂය	නියෝජිත ශීර්ෂය	වැය අංකය	මුදල (රු.)	ආයතනය	විස්තරය
215	306	1003	2,887,890.00	දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් වාර ප්‍රවේශ පත්‍ර
215	306	1003	6,337,473.00	දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් වාර ප්‍රවේශ පත්‍ර
215	306	1003	3,352,580.00	දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් වාර ප්‍රවේශ පත්‍ර
215	211	1201	1,390,637.50	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ශිෂ්‍ය හැඳුනුම් පත මුද්‍රණය
එකතුව			13,968,580.50		

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2023.12.31. දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු)	2023.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රු)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,948,999,568.70	2,948,999,568.70		*
9152	යන්ත්‍රෝපකරණ	1,364,393,722.41	1,341,258,909.76		98%***
9153	ඉඩම්	4,557,012,250.00	4,308,992,250.00		*
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ	335,507,204.40	335,507,204.44		**
9180	බදු දෙන ලද වත්කම්				

***** අයිතිය තහවුරු නොවූ සහ තක්සේරු කිරීම් සඳහා ඉදිරිපත් කල ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමෙන් පසු ප්‍රාග්ධනිත කර ගිණුම් ගත කරනු ලැබේ

****** ආණමඩුව කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ ලෙස අඩුපාඩු නිම කිරීමෙන් පසු ප්‍රාග්ධනිත කරනු ලැබේ.

******* MSVRI/Acc/15/27/2024 ලිපියට අනුව වැය අංක 126-02-21-2103 (13) රු. 298,025,237.63 හා වැය අංක 126-02-21-14 (2103) (17) රු. 144,404,723.00 2024 වර්ෂයේදී ප්‍රාග්ධනිත කරනු ලැබේ.

3.9 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. VOT/E/DTET/2023/FA/20

මගෙ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024 මැයි 31 දින

05 JUN 2024
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ
දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල්,

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018/ අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.-

---

යථෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

එම්.පී.අයි.එම්.රශ්මි

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත - ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යක්ෂක ජනරාල්,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VOT/E/DTET/2023/FA/20 | ඔබේ අංකය உமது இல. Your No. | දිනය திகதி Date 2024 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරී

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කල මතය

ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 30 දින නිකුත් කරන ලදී . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

ශ්‍රී මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක්

නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) 1.6.1 (ඇ) ඡේදයේ සඳහන් කරුණ හැර ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අංක 05/2023 දරන හා 2023 නොවැම්බර් 30 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයෙහි 8.2 වගන්තිය අනුව වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබෙනම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයකට ගිණුම්ගත කළයුතු වුවද තාක්ෂණ / කාර්මික විද්‍යාල 17 ක් වෙත , සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් විදේශ ණය ව්‍යාපෘති හා දේශීය ආයතන වලින් පරිත්‍යාග ලෙස වර්ෂ කිහිපයක සිට ලැබී තිබූ ධාවන තත්වයේ පවතින වාහන 61 ක වටිනාකම හා කාර්මික විද්‍යාල 23 කට අයත් ගොඩනැගිලි 237ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය නොවන වත්කම්වලට අදාල SA 80 භාණ්ඩාගාර පරිසණක මුද්‍රිතය අනුව යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම් වල වටිනාකම රු.23,134,812ක් වූ අතර SA 82 භාණ්ඩාගාර පරිසණක මුද්‍රිතය අනුව එය රු.24,966,179 ක් වුයෙන් රු.1,831,367ක වෙනසක් පැවතුණි.

(ඇ) 2019 - 2023 දක්වා කාලයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල නිර්දේශ කර තිබූ අපහරණය කල යුතු වත්කම් වලින් බොහොමයක් වත්කම් අපහරණයට ලක් වී තිබූ නමුත් ඒවායේ පිරිවැය ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) විගණන නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 18 කට අදාලව වටිනාකම රු.1,132,444ක් වූ පුනරාවර්තන ස්වභාවයෙන් යුතු ගොඩනැගිලි, යන්ත්‍ර සූත්‍ර සහ වාහන නඩත්තු වියදම් අදාල වැය විෂයයන් වල ඉතිරියන් ඉක්මවීම වලක්වා ගැනීමේ අරමුණින් ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ ගිණුම්ගතකර තිබුණි.

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත කරුණු නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණය
(අ)	බැරකම් ලේඛනය	මුදල් රෙගුලාසි 214	යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	පොදු තැන්පතු ලේඛනය	මුදල් රෙගුලාසි 565(2) (4)	යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ඇ)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891	පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

නිසි පුරෝකථනයකින් හා තාර්කික පදනමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු පිලියෙල කිරීම හේතුවෙන් වැය විෂයයන් 11 කින් රු.89,720,110 ක ප්‍රතිපාදන සියයට 50 ත් 100 ත් අතර පරාසයක් තුල වීරමොං ක්‍රියාමාර්ගය අනුගමනය කරමින් මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනය අඩු හෝ වැඩි කර ගැනීමට කටයුතු කර තිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

නීති, රීති, රෙගුලාසියට යොමුව		විගණන නිරීක්ෂණය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(2)	තැන්පතු ගිණුම් 03කට අදාලව තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ ඉකුත් තැන්පතු රු.11,854,632 ක් රජයේ ආදායමට බැර කිරීමෙන් තොරව පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි .
(ආ)	ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.4 වගන්තිය හා XLVIII වැනි පරිච්ඡේදයේ 14 වගන්තිය	2017 වර්ෂයේ පැවති කාර්මික පුහුණු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන සඳහා විදේශගත වූ නිලධාරියා ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ නොකර නැවත විදේශ ගත වී තිබියදීත් 2018 නොවැම්බර් 24 දිනැති මූලික විමර්ෂණ වාර්තාවේ නිර්දේශ පදනම් කරගෙන මෙම නිලධාරියාට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	අංක 30/2016 සහ 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	ආයතනය සතුව පැවති වාහන 69 ක් සම්බන්ධයෙන් 2022 වර්ෂයේ සිට ඉන්ධන දහන පරීක්ෂාවක් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3 තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව තත්කාර්යය අතුරු අග්‍රිමය ලබා ගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය නිම කල විගසම පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ නිලධාරීන් 13කට අවස්ථා 47 කදී ලබාදී තිබූ එකතුව රු.2,181,988 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම සඳහා දින 12 ත් දින 166 ත් අතර කාලයක් ප්‍රමාද කර තිබුණි.උක්ත චක්‍රලේඛයට අවධානය යොමුකර නිසි පාලන ක්‍රමයක් ඇති නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස නිලධාරීන් අත මෙම මුදල් රැඳවීමට අවස්ථාව සලසාදී තිබුණි.

(ආ) අවස්ථා 29 කදී රු.1,089,250 ක් වටිනා තත්කාර්යය අතුරු අග්‍රිම ලබාදීමේදී නිලධාරියෙකුට ලබා දුන් අග්‍රිමය පියවීමෙන් අනතුරුව නැවත අග්‍රිමය ලබාදිය යුතු වුවද නිලධාරීන් 07 කට ලබාදුන් අග්‍රිම පියවීමට පෙර තවත් අග්‍රිමයක් එම නිලධාරීන්ටම නිකුත් කර තිබුණි.

2.4 තැන්පතු

2023 දෙසැම්බර් 31 දිනට රු.48,036,824 ක මුදලක් ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීමේ ගිණුම තුල රඳවාගෙන තිබුණද එයින් රු.27,177,140 ක මුදලක් අදාල කාලය තුලදි භාණ්ඩාගාරයට හා අනෙකුත් ආයතන වලට ප්‍රේෂණය කිරීමකින් තොරව හා අදාල පරිදි කටයුතු කර අදායමට ගැනීමකින් තොරව එම ගිණුමේ රඳවාගෙන තිබූ බවට නිරීක්ෂණය විය.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මාස 06 කට වඩා වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ දෙපාර්තමේන්තු ගිණුමට අදාල රු.300,487 ක් වටිනා චෙක්පත් 32 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවෙහි 2023 ජනවාරි සිට නොවැම්බර් දක්වා අවස්ථා 32 කදී බැංකුවට තැන්පත් කර තිබූ රු.44,050 ක් සහ කාර්මික/ තාක්ෂණ විද්‍යාලයන්හි හඳුනා නොගත් ලැබීම් රු.419,554 ක් වර්ෂය අවසාන වන විටත් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 වත්කම් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුව විසින් මුල් අවස්ථාවේදීම නීතිමය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් කෑගල්ල කාර්මික විද්‍යාලයට අයත් පර්චස් 16 ක් 1987 වර්ෂයේ සිට අනවසර පදිංචිකරුවකු අත්පත් කරගෙන තිබුණි.

(ආ) රත්මලාන කාර්මික විද්‍යාලය පිහිටි අක්කර 05 රූඩ් 03 පර්චස් 6.31 ක් වූ ඉඩමෙහි ප්‍රදාන පත්‍රය හෝ ඉඩම් ඔප්පුව කාර්මික විද්‍යාලය හෝ දෙපාර්තමේන්තුව සතුව නොපැවතීම හේතුවෙන්ද හා දඹුල්ල කාර්මික විද්‍යාලය පිහිටි අක්කර 12 පර්චස් 6.83 ක් වූ ඉඩම සම්බන්ධව මාතලේ දිසා අධිකරණයේ අංක පී 2507 දරන නඩු කටයුත්තක් පවතින බැවින්ද එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වී තිබුණි.

(ඇ) අනුරාධපුර තාක්ෂණ විද්‍යාලයෙහි නිල නිවාස, සාද නිවාසය හා සංචාරක බංගලාව පිහිටා ඇති පොන්නාවරන්කුලම කැලේ අක්කර 04 රූඩ් 01 පර්චස් 25.69 ක් වූ ඉඩම් ප්‍රමාණය සම්බන්ධව අනුරාධපුර විශ්වවිද්‍යාල විද්‍යායතනය සමඟ පවතින ආරවුලක් හේතුවෙන් පවරා ගැනීම් කටයුතු ගැටළුකාරී වී තිබුණි.

(ඈ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සතු දේශන ශාලා 08 කින් හා වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු කාර්යාල උපකරණ වර්ග 45 ක ඒකක 591කින් යුත් TITP ගොඩනැගිල්ලේ තුන්වන මහල Southern Maritime Training Institute (Pvt) Ltd ආයතනය වෙත වසර 15 ක කාලයකට අවබෝධතා ගිවිසුමක් මත පළමු මාස 4 ට රු.500,000 බැගින්ද ඊලඟ මාස 8 සඳහා රු.700,000 බැගින්ද දෙවන වසර සිට මසකට අවම රු.1,200,000 හෝ ආදායමෙන් 5% ක් හෝ වැඩි අගය මත 2023 ඔක්තෝම්බර් 19 දින සිට ලබා දීමට කටයුතු කර තිබුණි. එසේ වුවද, අදාල ගිවිසුමට එළඹීමේදී 2020 ජූලි 20 දිනැති අංක 21/විවිධ(041) දරණ අමාත්‍ය මණ්ඩල තීරණය සහ 2023 සැප්තැම්බර් 26 දිනැති අංක අමප/23/1690/604/030-iv දරණ අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙවැනි ගිවිසුමකට එළඹීමට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ (ප්‍රධාන ගණන්දීමේ නිලධාරී) අනුමැතිය මඟින් අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දී තිබියදී එලෙස කටයුතු නොකර ගණන්දීමේ නිලධාරීගේ අභිමතය පරිදි ගිවිසුම්ගත වී තිබුණි. තවද මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබූ බැවින් මෙලෙස ගිවිසුම් වලට එළඹීම සහ ගණුදෙනු සිදු කිරීම විනිවිදභාවයෙන් තොර බව නිරීක්ෂණය විය.

3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 හා 881 (i) ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා කාර්මික/තාක්ෂණ විද්‍යාල වල ඇප ලබා ගත යුතු නිලධාරීන් එම තනතුරට පත්කල දින සිට මාස 2 ක් ඇතුලත ඇප ලබාගත යුතු වුවත් කිසිදු නිලධාරියෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි.

3.3 පාඩු හා හානි

මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ඇති රු.2,104,197 ක වටිනා අලාභ හානි අයිතම 06ක් එම අලාභ හානි සිදු වී වසර 05 ඉක්මවා ඇති අතර ඒ තුල වසර 10 ඉක්මවූ ශේෂ 03ක් පැවතියද ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

කුලියාපිටිය කාර්මික විද්‍යාලය ආසන්නයේ පිහිටි වැවෙවත්ත ඉඩමෙහි අක්කර 08 ක භූමි කොටසක අයිතිය පවරා ගැනීමකින් තොරව කෘෂි තාක්ෂණික ආදර්ශ ගොවිපලක් ඉදිකර තිබූ අතර බලාපොරොත්තු වූ අරමුණු ඉටු නොවීම හේතුවෙන් කාර්යයන් 09 ක් සඳහා දරන ලද රු.8,113,733 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

තවද, ඉහත ගොවිපොල ඉදිකිරීමේ කාර්යයන් සඳහා රු.897,600 ක (1100x816) වියදමක් දරා මිලදීගත් 816 ක සිමෙන්ති මිටි අදාළ කාර්යයන් සඳහාම යොදාගත් බවට තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ සිට වෙනත් අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තු හා පළාත් සභා ආයතන සඳහා ස්ථාන මාරු වී ගිය , මිය ගිය, විශ්‍රාම ගිය,වැඩ තහනම් කල,සේවය අවසන් කල, සේවය අතහැර ගිය, නිලධාරීන් 63 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.5,119,650ක ණය ශේෂයක් පැවති අතර එයින් වර්ෂ 03 කට වඩා වැඩි කාලයක සිට පැවත එන නිලධාරීන් 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,378,403 ක ශේෂයක් අය වීම ප්‍රමාද තත්වයක පැවතුණි.

(ආ) කාර්මික/තාක්ෂණ විද්‍යාලයන්හි දේශන කටයුතුවල නිරත වන පුහුණු සහකාර (අධ්‍යයන) නිලධාරීන්ගේ පත්වීම් ලිපි වල සඳහන් රාජකාරි කාලය හා යෙදවන කටයුතු , නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 01/2013 චක්‍රලේඛය මඟින් දක්වා ඇති පරිදි අධ්‍යයන කාලය සම්පූර්ණ නොකරන ලද අධ්‍යයන නිලධාරීන්ට අභිමතය පරිදි බැහැරයාමට ඉහල කළමනාකාරිත්වය අවස්ථාව සලසා දී තිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස කාර්මික/ තාක්ෂණ විද්‍යාලවල පුරප්පාඩු පවතින අධ්‍යයන අංශයේ කාර්ය මණ්ඩලය සඳහා බාහිර දේශකවරුන්ගේ සහාය අඛණ්ඩව ලබා ගැනීමට සිදුව තිබීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුල බාහිර දේශක දීමනා සඳහා රුපියල් මිලියන 138 ත් 302 ත් අතර පරාසයක වියදමක් දැරීමට සිදුව තිබුණි.

(ඇ) **ශිෂ්‍ය කාර්යසාධනය**

(i) 2020, 2021 සහ 2022 වර්ෂවලදී වාර්ෂිකව බඳවා ගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා අඩු ශිෂ්‍යයින් ප්‍රමාණයක් බඳවා ගැනීමට කටයුතු කර පැවතුණි.2022 වර්ෂයේ ඉලක්ක ගත ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 70 දක්වා පහල ගොස් තිබූ අතර ශිෂ්‍ය බඳවා ගැනීම සැලකිය යුතු මට්ටමකින් පහල යාමට පාඨමාලා පිළිබඳ දැනුවත්භාවය අඩු වීම ප්‍රධාන හේතුවක් ලෙස නිරීක්ෂණය විය .

(ii) වාර්ෂිකව පාඨමාලා සඳහා බඳවාගත් ශිෂ්‍යයින්ගෙන්, පාඨමාලාව සම්පූර්ණ කල ශිෂ්‍යයින්ගේ ප්‍රමාණය වාර්ෂිකව වැඩිවීමකින් තොරව ඒකාකාරී මට්ටමක පවතින බවත් 2020,2021,2022 වර්ෂවලදී බඳවාගත් මුළු ශිෂ්‍යයින්ගෙන්,පාඨමාලා සම්පූර්ණ කල ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 54ත් සියයට 64ත් අතර පරාසයක පැවතුණි.

(ඈ) කැගල්ල සහ වරකාපොල කාර්මික විද්‍යාල පිළිබඳ විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා විද්‍යාලයන් වෙත ලද අයදුම්පත් වලින් බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව, ලද අයදුම්පත් සංඛ්‍යාවෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 37 හා 29 ක් වූ අතර ඒ හේතුවෙන් වෘත්තිය පුහුණුව සඳහා ඉහළ ශිෂ්‍ය ඉල්ලුමක් පැවතියද ඉල්ලුමට සාපේක්ෂව බඳවා ගැනීම් වැඩිකිරීමට අවශ්‍ය කටයුතු ඉටු කර නොතිබීමෙන් උසස් අධ්‍යාපන වරම් නොලද සිසුන්ට වෘත්තිය පුහුණුව ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි

(ii) 2021, 2022 හා 2023 අධ්‍යයන වර්ෂයන්හි කැගල්ල කාර්මික විද්‍යාලයේ අවස්ථා 36 කදී හා වරකාපොල කාර්මික විද්‍යාලයේ අවස්ථා 26 කදී සිසුන්ගේ විභාග සමත්වීම පාඨමාලාව සඳහා ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව සියයට 50 ට වඩා අඩු අගයක් ගෙන තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව හා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන කාර්මික/ තාක්ෂණ විද්‍යාලයන් සඳහා අනුමත නොවූ තනතුරු 07ක් සඳහා නිලධාරීන් 18 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර තනතුරු 07ක අතිරික්ත 53ක් හා තනතුරු 52ක පුරප්පාඩු 1600ක් පැවතුණි.

(ආ) කාර්මික හා තාක්ෂණ විද්‍යාලයන්හි රසායනාගාර සහයක තනතුරු 31 ක් පුරප්පාඩුව පැවතියදී අනුමත නොවූ තනතුරක් වන රසායනාගාර සහායක තනතුර දරන නිලධාරීන් 05 දෙනෙකු ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත කර තිබුණි.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

4 වන පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

දෙපාර්තමේන්තුවේ කාර්යසාධන දර්ශක

විශේෂිත දර්ශකය	කාර්යසාධන දර්ශකය ගණනය කිරීම	සැබෑ ප්‍රතිඵලය අපේක්ෂිත ප්‍රතිඵලයේ ප්‍රතිශතයක් (%) ලෙස			විශේෂ කරුණු
		100 % -90 %	75 %- 89%	50 %- 74%	
1. පාඨමාලා සම්පූර්ණ කරන ප්‍රතිශතය	පාඨමාලා සම්පූර්ණ කල ශිෂ්‍ය සංඛ්‍යාව X 100 බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව		√		
2. පුහුණු ධාරිතා උපයෝජන ප්‍රතිශතය	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100 බඳවාගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව		√		
3. ශිෂ්‍ය බඳවාගැනීමේ ප්‍රතිශතය	බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100 අයදුම්කළ සංඛ්‍යාව			√ අයදුම් කළ සංඛ්‍යාවෙන් 60 % කට වඩා වැඩි ප්‍රමාණයක් බඳවා ගෙන ඇත.	
4. ඒකක පුහුණු පිරිවැය (රු)	වාර්ෂික මුළු පුනරාවර්තන පිරිවැය වර්ෂයට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව				රු. 66,365.00
5. රැකියාගතවීමේ ප්‍රතිශතය	රැකියාගත සංඛ්‍යාව X 100 පාඨමාලා සම්පූර්ණ කල සංඛ්‍යාව			√	රැකියාගත තොරතුරු වාර්තා කිරීම සඳහා දෙපාර්තමේන්තු වේ වෙබ් අඩවිය හරහා පහසුකම් සපයා ඇත.
6. මුළු වියදම් සඳහා ආදායම් උත්පාදිත අරමුදල්	පාඨමාලා ගාස්තු ලෙස අයකල මුදල් ප්‍රමාණය x100 වාර්ෂික මුළු පුනරාවර්තන වියදම				4%
7. පවතින අධ්‍යයන කාර්යමණ්ඩල ධාරිතාව	දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100 අවශ්‍ය උපදේශක සංඛ්‍යාව				47 %
8. අනුමත සේවක සංඛ්‍යාව මත පදනම්ව උපදේශකවරුන්ගේ ධාරිතාව	දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100 අනුමත සේවක සංඛ්‍යාව				41 %

5 වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක

ඉලක්කය අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ දර්ශක	ඉලක්ක සපුරා ගැනීම් වල ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% - 100%
4.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	4.3: 2030 වන විට, සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහල සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාලය අධ්‍යාපනයද ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.	4.3.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගිත්ව අනුපාතය	වාර්ෂිකව බඳවාගත් කාන්තා සිසුන් සංඛ්‍යාව	√ 42% ක කාන්තා ශිෂ්‍ය සංඛාවක්		
	4.4: 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්ව සඳහා තාක්ෂණික සහ වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයන් හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය මට්ටමකින් ඉහල දැමීම.	4.4.1 කුසලතාවයේ අකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහණයේ ප්‍රමාණය	වාර්ෂිකව බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව		√ අයදුම් කළ සංඛ්‍යාවෙන් 60 % කට වඩා වැඩි ප්‍රමාණයක් බඳවා ගෙන ඇත.	
	4.ඇ: 2030 වන විට අන්තර්ජාතික සහයෝගය තුළින් විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් වෙමින් පවත්නා රටවල ගුණාත්මක වශයෙන් ඉහළ ගුරුවරුන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.	4.ඇ1 අදාළ රටෙහි එක් එක් මට්ටම සඳහා ඉගැන්වීම සඳහා අවශ්‍ය වන පූර්ව සේවාස්ථ හෝ සේවාස්ථ (අ) පූර්ව ප්‍රාථමික, (ආ) ප්‍රාථමික , (ඇ) පහල ද්විතියික , සහ (ඈ) ඉහල ද්විතියික අධ්‍යාපනය යන අංශයන්හි අවම සංවිධානාත්ම පුහුණුව හෝ ලබා ඇති ගුරුවරුන් ප්‍රමාණය.	ධාරිතාව ගොඩනැගීම සඳහා පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	√		
	4.5: 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතා ඉවත් කර සමාන ප්‍රවේශයක් ලබා දීම. සමාජයේ සියළු මට්ටම් සහිත පුද්ගලයන්ට අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව ලබා දීම (ආබාධිතයන්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි තත්වයන් වල සිටින ළමුන්)	4.5.1 සියලු අධ්‍යාපනික දර්ශක සඳහා වන සමානාත්මතා දර්ශක වෙන්කොට දැක්විය හැකිය (ස්ත්‍රී/පුරුෂ, ග්‍රාමීය/නාගරික, ධනවත්භාවයේ මට්ටම යන පංචමකය සහ ආබාධිත මට්ටම, ස්වදේශීක ජනයා සහ ගැටුම් බලපෑම ආදී දත්ත පවත්නා බව අනුව)	වෘත්තීය පාඨමාලා බඳවා ගැනීම සඳහා සමාන අවස්ථා ලබා දීම ආබාධිත සිසුන් සඳහා පහසුකම් සහිත විද්‍යාල සංඛ්‍යාව ආර්ථික වශයෙන් සෞඛ්‍ය සම්පන්න නොවන පවුල් සඳහා ශිෂ්‍ය දීමනා සහ ශිෂ්‍යාධාර සංඛ්‍යාව		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

ජයග්‍රහණ

- ශිෂ්‍ය බඳවාගැනීම් වැඩි කිරීම සඳහා 2023 අයවැයයෙන් වෙන්වූ ප්‍රතිපාදන මගින් විද්‍යාල වල වැඩහල් පහසුකම් හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට යොදා ගැනීම.

- පවතින ආර්ථික අර්බුදය හමුවේ වියදම් කලමණාකරණය කර ගැනීම සඳහා මාර්ගගත මෙන්ම භෞතිකව (මිශ්‍රව) පාඨමාලා පැවැත්වීම.

- හදුනාගත් කර්මාන්ත පාඨමාලා සඳහා නිපුණතා සිසු සවිය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ලබා දීම සහ ශිෂ්‍ය සුභසාධන පහසුකම් ලෙස සහනදායි වාර ප්‍රවේශපත්‍ර ලබා දීමට හැකි වීම.

- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අධීක්ෂණ මට්ටමේ රැකියා සඳහා සුදුසුකම් ලැබූ සිසුන් 2707 ක් සඳහා NVQ 5 සහ 6 මට්ටමේ ඩිප්ලෝමා සහතික 2023 වර්ෂයේදී ප්‍රදානය කිරීමට හැකිවීම.

- විදේශීය මූල්‍ය පාර්ශවකරුවන්ගේ (කොරියානු රජය, එක්සත් ජනපද ආධාර, GIZ) සහයෝගය ලබාගෙන පාඨමාලා නවීකරණය කිරීමට හැකිවීම.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තෝරාගත් පාඨමාලා සඳහා ඉගැනුම් මාර්ගෝපදේශ සකස් කිරීම,වැඩහල් යාවත්කාලීන කිරීම සහ රැකියාගත පුහුණු ක්‍රියාවලිය නිසි අයුරින් සිදු කිරීම සඳහා පුහුණු උපායමාර්ග සකස් කිරීම.

- හෝටල් ක්ෂේත්‍රයට අදාල පාඨමාලා ආරම්භ කිරීම හා පුළුල් කිරීම සඳහා පෞද්ගලික ආයතන සමඟ එකාබද්ධ අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම තුලින් පාඨමාලා ආරම්භ කිරීම .

අභියෝග

- සමාජීය ආකල්ප හේතුවෙන් වෙල්ඩින්,පෙදරේරු , ලී වැඩ වැනි කර්මාන්ත පාඨමාලා සඳහා සිසුන්ගේ අඩු ආකර්ෂණයක් පැවතීම.

- වෘත්තීය පාඨමාලා සඳහා කාන්තා සිසුන්ගේ සහභාගීත්වය සාපේක්ෂව අඩුවීම.

- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා අවශ්‍ය වන සහිත යටිතල පහසුම් සහ විශේෂිත පුහුණු පාඨමාලා අවම වීම.

- වෘත්තීය අධ්‍යාපන අංශයේ හදුනාගත් අංශවල පුරප්පාඩු පිරවීමට හැකියාවන් ඇති වෘත්තිකයින් බිහිනොවීම හේතුවෙන් වෘත්තීය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට වක්‍රව බලපෑම් ඇති කරයි.

- නවීන තාක්ෂණය මෙන්ම කාර්මික අංශයට අදාළ නව තාක්ෂණට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය යාවත්කාලීන නොවීම.

6 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යාව කළමනාකරණය

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජේෂ්ඨ	1293	494	799
තෘතියික	144	60	84
ද්විතීක මට්ටම	1246	907	339
ප්‍රාථමික	1175	766	409
එකතුව	3858	2227	1631

6.1.1 2023.12.31 දිනට සේවක පුරප්පාඩු

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යයන	1473	549	924
අනධ්‍යයන	2385	1678	707
එකතුව	3858	2227	1631

6.1.2 කාර්යසාධනය මත අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වල බලපෑම

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 50 % ඉක්මවා ඇති අතර මේ වන විට බාහිර උපදේශකවරුන්ද යොදා ගනිමින් පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. කාර්මික අධ්‍යාපනය හා පුහුණුව තුලින් වඩාත් වෘත්තීය රැකියා අවස්ථා වෙත යොමු කළ හැකි පාඨමාලාවලට අදාළ වන ශිල්ප ප්‍රදර්ශක තනතුරු 115 ක් උපදේශක තනතුරු 200 ක් පිරවීම ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇති අතර මෙමඟින් කාර්මික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට සෘජු බලපෑමක් ඇති කල හැක.

6.2 මානව සම්පත් සංවර්ධන කාර්යසාධනය

2023 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

#	වැඩසටහන	පුහුණුව ලැබූ කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	මුළු ආයෝජනය (රු)		වැඩසටහන් ස්වභාවය (දේශීය/ විදේශීය)	ප්‍රතිඵලය
				දේශීය	විදේශීය		
1	SLTES හි II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ආයතන සංග්‍රහය මුදල් රෙගුලාසි සහ ජාතික හා ජාත්‍යන්තර කම්කරු වෙළඳපොළ පිළිබඳ පුහුණු පාඨමාලාව	108	පැය100 (මාර්ගගත)	510,000.00		දේශීය	ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන්ගේ කළමනාකරණ / පරිපාලන හැකියාවන් වර්ධනය කර කළමනාකරණ මට්ටමේ තනතුරු සඳහා අවශ්‍ය වෘත්තීමය පුහුණුව ලබාදීම.
2	ඉන්දීය රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ITEC ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය යටතේ පුහුණු වැඩසටහන	01	දින 40 2022.12.12 – 2023.02.03	223,000.00		විදේශීය	වෘත්තීයමය ලෙස යාවත්කාලීන වූ තොරතුරු තාක්ෂණ පුහුණුව ලබාදී නවමු වූ රාජ්‍ය සේවයකට නවක නිලධාරීනගේ ධාරිතා සංවර්ධනය.
3	අලුතින් බඳවාගත් ශිල්ප ප්‍රදර්ශකයින් සඳහා මූලික පුහුණු වැඩසටහන / වැඩමුළුව	12	දින 05 2023.05.22-26	18,590.00		දේශීය	රාජ්‍ය සේවයට බඳවා ගන්නා නවක නිලධාරීන්ට රාජකාරී වපසරිය හා විෂය දැනුම පිළිබඳ අවබෝධයක් ලබා දීම.
4	පුහුණු කරුවන් පුහුණු කරීම (වායු සමීකරණ හා ශීතකරණ අංශය)	01	දින 04 (මාර්ගගත)	-		විදේශීය	උපදේශකවරුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීම.
5	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සම්පත් ඉතිරිකිරීමේ සහ පරිසර හිතකාමී සමාජයක් බිහි කිරීම පිළිබඳ සම්න්ත්‍රණය	01	දින 13 (මාර්ගගත)	-		විදේශීය	උපදේශකවරුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීම.
6	පුනර්ජනනීය බලශක්ති පද්ධතිය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම පිළිබඳ කලාපීය වැඩසටහන	01	දින 04 (මාර්ගගත) 2023.02.20-24	-		විදේශීය	උපදේශකවරුන්ගේ විෂය දැනුම යාවත්කාලීන කිරීම තුළින් රැකියා ක්ෂේත්‍රය් ඉල්ලුමට අවශ්‍ය වන දැනුම ලබාදීම.
7	චීනයේ වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ පුහුණු වැඩසටහන	02	දින 13 2023.06.05-18	281,000.00		විදේශීය	චීනයේ කාර්මික විද්‍යාල තුළින් ශ්‍රී ලංකාවට ගතහැකි වැඩිදියුණු කිරීම් පිළිබඳ කළමණාකරුවන් පුහුණු කිරීම.

#	වැඩසටහන	පුහුණුව ලැබූ කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	මුළු ආයෝජනය (රු)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	ප්‍රතිඵලය
				දේශීය	විදේශීය		
8	ප්‍රධාන කාර්යාලයේ සහ විද්‍යාලවල රෙජිස්ට්‍රාර්වරුන් සහ විෂය නිලධාරීන් (DO/MSO) සඳහා පුද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	87	දින 01 2023.10.06	107,457.00		දේශීය	පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම සම්බන්ධ විෂය දැනුම ලබාදීම.
9	වෘත්තීය නායකයින් සඳහා කර්මාන්ත පිළිබඳ පුහුණු වැඩසටහනපි සිංගප්පූරුවේ තාක්ෂණය, තර්ජන සහ අවස්ථා)	01	දින 07 2023.10.08-14	49,900.22		විදේශීය	වෘත්තීය තාක්ෂණ ක්ෂේත්‍රයේ පරිපාලකයන් සඳහා අවශ්‍ය කළමනාකරණ කුසලතා සංවර්ධනය.
10	ඉන්දීය වෘත්තීය අධ්‍යාපනය ඩිජිටල්කරණය පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 10 2023.11.14-23	131,892.00		විදේශීය	වෘත්තීය අධ්‍යාපනයේ ඩිජිටල් කරණය සඳහා නවමු හා යාවත්කාලීන දැනුම ලබාදීම.
11	සංවර්ධන නිලධාරී සහ කළමණාකරණ නිලධාරීන් සඳහාවූ වැටුප් පරිවර්තනය පිළිබඳ පුහුණු වැඩසටහන	97	දින 01 2023.12.19	100,215.00		දේශීය	ප්‍රධාන කාර්යාලයේ හා විද්‍යාල වල වැටුප් පරිවර්තනයන් වඩාත් නිවැරදිව සකස් කිරීමට අවශ්‍ය දැනුම ලබාදීම.
12	ප්‍රාථමික ශ්‍රේණි සඳහා වූ කාර්යක්ෂමතා කඩයිම් විභාග පිළිබඳ පුහුණු වැඩසටහන	46	දින 02 2023.08.15 & 17	-		දේශීය	ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම අභිමුඛ කරගත් දැනුම ලබා දීම හා අභිප්‍රේරණය.
13	කොරියානු ව්‍යාපෘය යටතේ කර්මාන්ත ජලනල තාක්ෂණය, පරිසණක ආශ්‍රිත සැලසුම් කරණය හා සැලසුම් ශිල්පය පිළිබඳව දින 35 ක පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන, මරදාන තා.වි.	40	දින 35 2023-10.14- 2023.1121		KOICA ආධාර මඟින් දරන ලදී	දේශීය	කොරියානු මහාචාර්ය්‍යවරුන් මඟින් සකස් කරන ලද ඉගැනුම් අත්පොත් ආශ්‍රිතව ක්ෂේත්‍රයේ උපදේශකවරුන් හා ශිල්ප ප්‍රදර්ශකවරුන්ගේ දැනුම යාවත්කාලීන වීම.
14	රැකියාගත පුහුණු සංස්කෘතිය හා උපායමාර්ග පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	20	දින 05		KOICA ආධාර මඟින් දරන ලදී	දේශීය	රැකියාගත පුහුණු පිළිබඳව පුහුණු කරුවන් දැනුවත් කිරීම තුලින් රැකියාගත පුහුණුවේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම.

7 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූලවේ/අනුනකූල (නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත්කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ.	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් “ බී” ගිණුම.	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්.	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්.	අනුකූල වේ.		
1.6	වෙනත්	අනුකූල වේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 267/2018ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන පඩිනඩි / කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ(CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය(GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මු.රෙ.135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.		
3.4	අංක 2014.05.11 දරණ 171/204 දිනැති චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී එය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ.		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු .රේ . 134 (2)DMA – 1/2019 අනුව වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.		
6.3	අංක 40 (4) හි 2018දරණ පනතේ උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
6.4	මු.රෙ.134 (3) ට අනුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල	අනුකූල වේ.		

	පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.			
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA 1-2019 චක්‍රලේඛය අනුව වර්ෂය තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පවත්වා තිබීම.	අනුකූල වේ.		.
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 2017/01 හි 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ලේඛනය ප්‍රකාරව එහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සුදුසු නිලධාරියෙකු පත්කර ඒ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම.	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 ට අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ අදාළ කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.177 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගනකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 6 ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109,110.ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	අංක 2016/30 දරණ 2016.12.29 දිනැති ලේඛනයේ 3.1 පරිච්ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම	අනුකූල වේ.		
9.6	කල්බදු කාල සීමාව සම්පූර්ණ වාහනවල ලොග් පොත්වල අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ.		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ	අනුකූල වේ.		

	පිළියෙළ කර සහතික කර ඒවා , විගණනය සඳහා ඉදිරිපත් කිරීම.			
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.		
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරව උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ.		
12.	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟ ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.		නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග සැසඳීම.	අනුකූල වේ.		
15.	**ආදායම් ගිණුම**			

15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම.	අනුකූල වේ.		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ.		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	අංක 2017.09.20 හා 04/2017 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ඒ තුළින් මහජනයාගේ ප්‍රශංසා හා චෝදනා පල කිරීමටද පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 8 හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වතාවක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අංක 05/2018 (1) අනුව පුරවැසි ප්‍රඥප්තියක් සේවාලාභීන්ට සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව සේවාලාභී පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම් කටයුතු හා ක්‍රියාත්මක කිරීම / ඇගයීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදයක් ආයතනය විසින්ම සකස්කොට තිබීම.	අනුකූල වේ.		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			

19.1	රාජ්‍ය පරිපාලන අංක 2018/02 හා 2018.01.24 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර තැබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ.		
20.	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත්කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		